සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යාංශය(පුද්) සමාගම - 2019
--------------------------------------------------------------------------------

සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යාංශය(පුද්) සමාගමේ (“සමාගම”) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
--------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාදන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිවයුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

2.1 මූල්‍ය ප්‍රකාශන
---------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ හිටපු සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ධූර කාලය 2018 දෙසැම්බර් 31 න් අවසන් වීමෙන් පසු සමාගම සඳහා සභාපතිවරයෙක් පත්කර නොතිබුණු අතර 2019 මාර්තු 25 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් 2019 ජනවාරි 01 දින සිට සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිළධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. එසේ වුවද ජනාධිපති ලේකම්ගේ 2019 නොවැම්බර් 28 දිනැති අංක PS/SP/SB/Circular/02/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඔවුන් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත්ව තිබුණි. 2020 දෙසැම්බර් 31 වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණු හෙයින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. | එකග වෙමි. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 150(අ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු අතර ඒවන විට අධ්‍යක්ෂ මණ්ඩලය පුරප්පාඩු වීම නිසා අනුමැතිය ලබාගැනීමට හැකියාවක් නොමැති අතර මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩලය පත්වී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඉතා කඩිනමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. | 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය මඟින් නිළධාරීන් කාර්යාලයට පැමිණීම පිටවීම සම්බන්ධ වාර්තා වඩා විධිමත්ව පවත්වාගෙනයාමට හැකිවන හෙයින් සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා ඇඟිලි සළකුණු යන්ත්‍ර සෑම කාර්යාලයකම භාවිතා කළ යුතු වුවත් සමාගමේනිළධාරීන්ගේ පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | 2018 වර්ෂයේ මෙම ආයතනය වසා දැමීමට තිරණ කර තිබුණි. ඉදිරියේදී ඇඟිලි සලකුණ යන්ත්‍ර සවිකර පැමිණීමේ හා පිටවීම් සඳහා අභ්‍යන්තර පරිපාලනය විධිමත් කිරීමට පියවර ගැනීමට ක්‍රියාකරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය | වෙළඳපළ මිල සැදැහුම් ක්‍රමයට මිල කැඳවීමකින් තොරව සමාගමේ ආදායම් බදු ගණනය කිරීම සඳහා පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් පූර්ව වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු. 82,500 ක් හා රු. 75,000 ක් ගෙවා තිබුණි. | අදාළ කරුණු නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. සමාගමේ බදු කටයුතු සම්බන්ධව කටයුතු කරන ලද විගණන සමාගම ඉන් පෙර සමාගමේ විගණකයා ලෙසද කටයුතු කර තිබුණි. මේ සමාගම පිළිබඳව ඔහුට තිබූ වෘත්තීය අවබෝධය හා ප්‍රවීනතාවය පිළිබඳව සැලකිල්ලට ගෙන ආදායම් බදු ගෙවීමේ කටයුතු ඉහල වෘත්තීය මට්ටමකින් කරනු ලැබූ බව තවදුරටත් සඳහන් කරමි. කෙසේ වෙතත් ඉදිරියේදී විගණනය පෙන්වා දී ඇති පරිදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් තෝරාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයන්හි පරිච්ඡේද 17 හි 19 වගන්තිය | ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාගම සතු පිරිවැය රු. 2,513,233 ක් වූ වත්කම් අයිතම 20 ක් ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදල කරුණ නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. මේ සඳහා අධක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය වූ අතර, වර්තමානයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්වී ඇති බැවින්, වහාම නිවැරදි කිරීමට පියවර ගනිමි. වත්කම් මුළුමනින්ම ක්ෂයකර තිබුණද ස්ථාවර වත්කම් ලේඛණයේ එම වත්කම ඉවත්කර නොමැති බව සඳහන් කරන අතර නොපමාව එම වත්කම් ප්‍රත්‍යගණනය කොට පොත්වලට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බවට කාරුණිකව දන්වමි. ස්ථාවර වත්කම් ලෙස නොසැලකිය යුතු වත්කම් ස්ථාවර වත්කම්වලින් ඉවත් කර ගිණුම් නිවැරදි කිරීම සඳහා වහාම පියවර ගැනීමට අදාල උපදෙස් මා විසින් මේ වන විට ලබා දී ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනටමත් භාවිතයට ගන්නා ස්ථාවර වත්කම්වල ඵලදියී ජීව කාලය නැවත සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** මෙහෙයුම් සමාලෝචනය
--------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සැප්තැම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/19/2550/104/076 මගින් මෙම සමාගම ඈවර කිරීමට අනුමතිය දී තිබුණද පසුව 2019 ඔක්තෝබර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/19/2770/104/083 ප්‍රකාරව සමාගම කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා දීමට අනුමැතිය දී තිබුණි. එසේ වුවද 2021 පෙබරවාරි දක්වාම සමාගම පැවරීමක් සිදුකර නොතිබුණි. | 2019 ඔක්තෝබර් 15 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තිරණ අංක 19/2770/104/083 ප්‍රකාරව සමාගම අදාල විෂය භාර අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කරමින් සිටී. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් සමාගමේ කළමනාකාරීත්වය හෝ සභාපති මූල්‍යමය වංචාවලට සම්බන්ධ නම් ඒ සඳහා නීතිමය පියවර ගෙන ආයතනයට අවාසි සහගත නොවන ආකාරයකින් විසදිය යුතු බවත් ඒ සඳහා විධිමත් පරීක්ෂණයක් ආරම්භ කොට මාසයක් තුල කාරක සභාව වෙත වාර්තා කළ යුතු බවත් නිර්දේශ කර තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට මූල්‍ය වංචාව සම්බන්ධයයෙන් සැක කෙරෙන සභාපතිවරයා මියගොස් ඇති අතර අය කර ගැනීම සඳහා ගතහැකි නීතිමය පියවර අධ්‍යයනය කරමින් පවති. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් විසින් හිඟුරක්ගොඩ සමෘද්ධි ප්‍රජාමූල බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මහවැලි උපදේශන සේවා කාර්යාංශ (පුද්) සමාගම වෙත ප්‍රදානය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමකල යුතු දිනය **2017** දෙසැම්බර් **15** වුවද ඉදිකිරීම් අවසන් වී නොතිබුණු අතර **2018** ජුලි **15** දින සමාගම විසින් එහි ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. | මේ වන විට අදාල ගැටළුව විසඳී ඇත. හිඟුරක්ගොඩ සමෘද්ධි ප්‍රජාමූල බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල අවසන් වැඩ මේ වන විට නිම කර, **2020** මාර්තු මස සමෘද්ධි බැංකුව වෙත බාරදී ඇති අතර, එහි පැවති අඩුපාඩු නිමකල පසු ඉතිරි මුදල අපහට ලබාදීමට එකගතාවය පල කර ඇත. | සමාගම විසින් භාරගන්නා ඉදිකිරීම් ගිවිසුම් ප්‍රකාරව අදාල කාලය තුල නිසි ප්‍රමිතියෙන් නිමකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි දිමුතුවැව ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් සමාගම විසින් රු.**11,998,130** ක අවසන් බිල්පතක් ඉදිරිපත් කර තිබුණද, දිමුතුවැව පහළ නිම්නය සංවර්ධනය කිරීමේදී විෂයය පථයෙන් පරිබාහිරව සිදු කර ඇති බැවින්, එම මුළු මුදලම ගෙවීම් නොකිරීමට දිමුතුවැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව පත්කල කමිටුව නිර්දේශ කර තිබුණි. ඒ අනුව කමිටුව විසින් සමාගම වෙත ගෙවීමට නිර්දේශ කරන ලද මුළු මුදල රු.**4,840,515** ක් වූ අතර ඉන් ලබා දී තිබුණු රු**2,971,485** අත්තිකාරම් මුදල් අඩුකිරීමෙන් පසු රු.**1,869,030** ක් පමණක් සමාගමට ගෙවා තිබුණි. ඒ අනුව සමාගමට රු.**7,157,615** ක අලාභයක් සිදු වී තිබුණි. | නිරීක්ෂිත අලාභය දක්වා ඇති මිලගණන් වලට වඩා විශාල ලෙස අඩුවේ. අලාභයට හේතු වූ කාරණය ආයතනයේ පාලනයෙන් බැහැර වූ හේතුවක් වේ. විගණන නිරීක්ෂණය අනුව රු. **7,157,615** ක මුල්‍ය අලාභයක් සිදුවී ඇතැයි විගණන නිරීක්ෂණය මඟින් වාර්තා කරනු ලැබුවත් සමාගම විසින් ගණන් බලා ඇති පරිදි ශුද්ධ අලාභය රු. **2,621,669** පමණ වේ.ව්‍යාපෘතියක් කරගෙන යාමේදී නිරන්තරයෙන් සේවා දායකයා විසින් ලිඛිත ගිවිසුමේ බාහිරව වැඩ කටයුතු කර දෙන ලෙස ඉල්ලීම සිදුකිරීම සිදුවේ. රජයේ අමාත්‍යාංශයක් වශයෙන් ලිඛිත නොවන ලෙස ලැබුණ උපදෙස් ප්‍රකාරව සමාගම විසින් කොන්ත්‍රාත්තුවට අදාල අමතර වැඩ කරන ලද අතර ඒ සදහා අදාල අනුමැතිය ලැබී නොමැති හෙයින් මෙම ගැටළුවට මුහුණ දීමට සිදුවිය. | කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය අනුව පමණක් ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතු අතර අනුමැතියකින් තොරව අමතර වැඩ සිදුකර සමාගමට අලාභ සිදු වී තිබේනම් වගකිව යුතු පාර්ශව වෙතින් අදාල අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම කණේවෙල අමුණ ප්‍රතිසංස්කරණය කිරීමට එළඹ තිබුණු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගුකර තිබුණි. ඒ අනුව රඳවාගත් රු.**1,730,055** ක කාර්යසාධන සුරක්ෂණය අත්තිකාරම් සුරක්ෂණයේ නැවත නොගෙවන ලද රු.**1,000,089** ක ඉතිරි මුදල සහ රු.**419,421** ක රැඳවුම් මුදල්ද ඇතුළුව රු.**3,149,565** ක අලාභයක් සමාගමට සිදු වී තිබුණි. | නිරීක්ෂණය හා එකග වේ. ඒ වන විට සමාගම ඇවර කිරීමට ගෙන තිබූ තීරණයක් හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර ගැනීමට අවස්ථාවක් නොලැබුණි. කෙසේ වෙතත් රැඳවුම් මුදල වන රු.**419,421** මුදල සමාගමට අයකර ගැනීමට හැකි බව කාරුණිකව දන්වමි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ණයගැති කාල විශ්ලේෂණය අනුව **2019** දෙසැම්බර් **31** දිනට සමාගමේ ලැබිය යුතු ශේෂ වටිනාකම රු. **47,074,872** ක් වූ අතර, ඉන් රු. **4,176,453** ක් වටිනා ගිණුම් ශේෂ අවුරුදු **05** කට වඩා වැඩි කාලයක් අයකර ගැනීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගනිමි. අදාල මුදල පිළිබදව සුදුසු තීන්දුවක් ගැනීම සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සමාගමේ ලැබිය යුතු ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඉ) | ණයහිමි කාල විශ්ලේෂණය අනුව **2019** දෙසැම්බර් **31** දිනට රු.**24,170,130** ක ගෙවිය යුතු ගිණුම් ශේෂයන් පැවති අතර, ඉන් රු.**8,576,246** ක ගෙවිය යුතු ගිණුම් ශේෂයන් අවුරුදු **05** කට වඩා වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය. එම ශේෂය තුල වැඩ නිමකර තිබුණු උපදේශන සේවාවලට අදාල රු.**7,991,483** ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් **4** ක් ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. ගිණුම්වල නිවැරදි කිරීම සඳහා අදාල අංශ වෙත උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. | ගෙවිය යුතු ගිණුම් ශේෂයන් නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු සිදුකරන ව්‍යාපෘති හා ඉංජිනේරු අංශවල ප්‍රධානීන් ලෙස සේවය කළ නිළධාරීන් දෙදෙනා පිළිවෙලින් **2018** දෙසැම්බර් **31** දින සහ **2019** පෙබරවාරි **28** දින ඉවත් වී තිබුණු අතර එදින සිට එම තනතුරු පුරප්පාඩු වී තිබුණි. **2019** වර්ෂය සඳහා ව්‍යාපෘති හා ඉංජිනේරු අංශවලින් කිසිදු නව මෙහෙයුම් කටයුත්තක් භාරගෙන නොතිබුණු අතර **2018** වර්ෂයේ සමාගමේ රු මිලියන **90.2** ක් වූ මෙහෙයුම් ආදායම **2019** වර්ෂයේදී රු මිලියන **29.8** දක්වා සියයට **67** කින් පහළ ගොස් තිබුණි. | සමාගම ඈවර කිරීමට ඒවකට ප්‍රතිපත්තිමය තීන්දුවක් තිබුණ බැවින් මෙම තනතුරු පිරවීම අත්හිටුවා තිබුණි. නමුත් එම ප්‍රතිපත්තිමය තීරණය වෙනස්වී ඇති බැවින් බඳවා ගැනීම කඩිනම් කිරීම සිදුකෙරේ. | සමාගමේ පරිපාලන ගැටළු විසඳා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | **2013** වර්ෂයේදී ගිවිසුම්ගතවී තිබුණු පහළ මල්වතු ඔය ව්‍යාපෘතියේ හා කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා සැකසීම වෙනුවෙන් සමාගමට අයවියයුතු රු.**2,642,750** ක මුදලක් **2020** දෙසැම්බර් **31** වන විටත් අයකරගෙන නොතිබුණි. | එකඟ නොවේ. එම මුදල අයකර ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවති. මධ්‍යම පරිසර අධිකාරිය සහ වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් ලබා දිය යුතු අනුමැතීන් ලැබුණු පසු, වහාම මෙම මුදල අයකර ගැනීමට හැකිවන අතර, නොපමාව කටයුතු කරන බව දන්වමි. | සමාගමට අයවියයුතු සියළු මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබා දීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට අය විය යුතු රු.මිලියන **20.2** ක් මේ දක්වා අදාල වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගෙන නොතිබුණි. | අදාල මුදල අයකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව කාරුණිකව දන්වමි. | සමාගමට අය විය යුතු මුදල් අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ස්ථාවර වත්කම් ලේඛනයට අනුව **2019** දෙසැම්බර් **31** දිනට මහවැලි උපදේශක සේවා කාර්යාංශය සතුව රු. **16,749,105** ක් වටිනා වත්කම් පැවති නමුත්, අදාල වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | සමාගම විසින් භෞතික සත්‍යාපනය සිදුකර තිබුණද එය රජයේ වත්කම් සත්‍යාපනය සඳහා අදාලව වත්කම් සමීක්ෂණ ක්‍රම වේදයට අනුකූලව පත්කරනු ලැබූ මණ්ඩලයක් විසින් කර නොතිබිණි. කෙසේ වෙතත් **2021** වර්ෂයේදී මේ සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | කිවුල්ඔය ජලාශය සහ පහළ මල්වතු ඔය ජලාශය ව්‍යාපෘතිවල උපදේශන සේවා සැපයීම සඳහා ඇතිකරගන්නා ලද ගිවිසුම් පිළිවෙලින් **2015** දෙසැම්බර් **31** දිනෙන් සහ **2017** දෙසැම්බර් **04** දිනෙන් අවසන්වී තිබුණද, ගිවිසුම් කාලය දීර්ඝකර ගැනීමකින් තොරව එම ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම් කෙටුම්පත් වාර්තාවල අමතර පිටපත් **37** ක් **2020** වර්ෂයේදී ලබාදී තිබුණි. ඒ වෙනුවෙන් රු. **198,000** ක අමතර වියදමක් සමාගමට දැරීමට සිදුවී තිබුණි. එසේම මල්වතුඔය ව්‍යාපෘතිය වෙනුවෙන් උප වාර්තා **(Addendum)** පිටපත් **23** ක් ලබාදී තිබුණද උපවාර්තා ලබාදීමේදී අයකරන ගාස්තු පිළිබඳ උපදේශන ගිවිසුමේ කොන්දේසි ඇතුළත් වී නොතිබුණි. | නිරීක්ෂණය හා එකග නොවේ. මධ්‍යම පරිසර අධිකාරිය මගින් තවමත් අදාල අනුමැතීන් ලැබී නොමැති බැවින් මේ දක්වා නිර්මාණ ඇගයීම් පිටපත් අවසන් වාර්තවේ පිටපත් නොවන අතර එය කෙටුම්පත් වාර්තා පමණි. කෙටුම්පත් වාර්තා වෙනුවෙන් වෙනමම මුදල් අයකරගැනීමක් සමාගම විසින් සිදුනොකරන අතර සියළු වියදම් සහිත වූ මුදලක් අවසන් වාර්තාව ලබා දුන් පසු අයකරගැනීම ගිවිසුම්වල සිදුකිරීම සාමාන්‍ය ක්‍රියාපටිපාටිය වේ. | ගිවිසුම් කාලයෙන් පසුව ලබාදුන් අමතර පිටපත් සඳහා වැය කළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම් කාලය අවසන් වී ඇති ගිවිසුම්වල කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතුය. |